# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2059/53 - 2018 පෙබරවාරි මස 23 වැනි සිකුරාදා - 2018.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(XVI)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 140 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2018 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2018 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට බලාත්මක විය යුතු ය.

2. 2017 මැයි මස 05 වන දින අංක 2017/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමාවලිය මගින් අවසන්වරට සංශෝධිත 1980 අප්‍රේල් මස 10 වන දින අංක 83/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 13 වන ඡේදයේ -

"(i) (1) වන අනුඡේදයෙහි (ච) හා (ජ) අයිතමයන් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමයන් ආදේශ කිරීමෙන් :-

"(ච) කන, නාසය සහ උගුර පිළිබඳ වෛද්‍ය වේදය ;

(ජ) සායනික පිළිකාවේදය ;";

(2) එහි 14 වන ඡේදයේ -

(i) (1) (ඈ) (ii) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

"(ii) ක්ෂුද්‍ර ජීව විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල වෛද්‍ය, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා යන පීඨවල පරපෝෂවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන් (මූලාසන), මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන්, අධ්‍යයන අංශ ප්‍රධානීන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරාපත්කර ගන්නා ලද සාමාජිකයන් තිදෙනෙකු ;";


1A - PG 3927 — 107 (2018/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) (1) (ඉ) (i) (අ) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

''(අ) ප්‍රසව හා නාරි වෛද්‍ය විශේෂඥ ක්ෂේත්‍රවලින් හැර ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානයකින් නියෝජිතයන් තිදෙනෙකු ;'';

(iii) (1) (ඉ) (i) (ආ) (viii) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් ;

''(ඇ) මනෝ චිකිත්සාව විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහලේ නියෝජිතයකු වෙනුවට අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නම් කරනු ලැබූ රිජ්වේ ආර්යා ළමා රෝහලේ නියෝජිතයකු ;'';

(iv) එහි (1) (ඉ) (iii) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

''(iii) ප්‍රජා වෛද්‍ය විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පහත දැක්වෙන පිළිගත් එක් එක් පුහුණු මධ්‍යස්ථානවලින් චාරිකව මාරුවීම මත පදනම්ව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයන් දස දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් :-

(අ) මැලේරියා මර්දන ව්‍යාපාරය ;

(ආ) සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය ;

(ඇ) පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය ඒකකය ;

(ඈ) කළමනාකරණ, සංවර්ධන සහ සැලසුම් ඒකකය, සෞඛ්‍ය අමාත්‍යාංශය ;

(ඉ) බෝ නොවන රෝග පිළිබඳ ඒකකය ;

(ඊ) ජාතික සෞඛ්‍ය විද්‍යායතනය ;

(උ) වසංගත රෝග විද්‍යා අංශය ;

(ඌ) ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන ;

(එ) පවුල් සෞඛ්‍ය කාර්යාංශය ;

(ඒ) ක්ෂය රෝග මර්දන සහ ශ්වසන රෝග සඳහා වන ජාතික වැඩසටහන ;''

(v) (1) (ඉ) (vii) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් ;

''(viii) විකිරණවේද විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන්, රිජ්වේ ආර්යා ළමා රෝහලෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයකු ;''

(vi) (2) (ඈ) (i) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

''(ඈ) (i) සායනික පිළිකා, වෛද්‍ය පරිපාලනය හා කාම ව්‍යාධි වේදය යන විශේෂඥ ක්ෂේත්‍රයන්ගෙන් හැර -'';

(vii) (2) (ඈ) (ii) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

''(ii) කන, නාසය සහ උගුර පිළිබඳ වෛද්‍යවේදය සම්බන්ධයෙන් වූ විශේෂඥ ක්ෂේත්‍රයෙහි (2) (ඈ) (i) (අ) සහ (ආ) අනුඡේදයන් යටතේ වූ නියෝජිතයන්ට අතිරේකව, රිජ්වේ ආර්යා ළමා රෝහලේ නියෝජිතයකු'' ;

(viii) (2) (ඈ) (iv) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

''(iv) මෙම ඡේදයේ (2) (ඈ) (i) (ආ) අනුඡේදයේ සඳහන් පුහුණු මධ්‍යස්ථානයන්ගෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නම් කරනු ලබන කාමව්‍යාධිවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රයට අදාළ නියෝජිතයන් නවදෙනෙකු, මේ අතුරින් අවම වශයෙන් තිදෙනෙකු පහත ආයතනවලින් විය යුතු ය :-

(අ) මහරගම පිළිකා ආයතනය ; සහ

(ආ) (මින්මතු ''STD ක්ලිනික්'') යනුවෙන් හඳුන්වනු ලබන ලිංගාශ්‍රිත රෝග සම්ප්‍රේෂණ සම්බන්ධයෙන් වූ සායනය ;'';

(ix) 2 (ඇ) (v) අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

''(v) චර්මවේද විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නම් කරනු ලබන රිජ්වේ ආර්යා ළමා රෝහලේ නියෝජිතයකු ;'';

(x) (2) (ඇ) (vi) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් :-

''(ඉ) අදාළ වෘත්තීමය මණ්ඩලයෙන් සාමාජිකයන් දෙදෙනෙකු ;

එසේ වුවද, ශ්‍රී ලංකාවේ යම් විශ්වවිද්‍යාලයක් හෝ විශ්වවිද්‍යාල එකකට වැඩි ගණනක්, 14(2) ඡේදයේ සඳහන් විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අධ්‍යයන අංශයක් පිහිටුවනු ලබන විට, අදාළ අධ්‍යයන මණ්ඩලය විසින් එකල්හි තීරණය කරනු ලබන අතිරේක විධිවිධාන සහිතව හෝ රහිතව එම විශේෂඥ ක්ෂේත්‍රය ස්වයංක්‍රීයව 14(1) ඡේදය යටතට ඇතුළත් විය යුතු ය.'' ;

(xi) (3) (අ) අනුඡේදයෙහි ''(1) වන සහ (2) වන අනුඡේදවල සඳහන් අධ්‍යයන සභාවේ සියලු සාමාජිකයන් පුහුණුකරුවන් විය යුතු ය.'' යන වචන වෙනුවට ''14 ඡේදයෙහි සඳහන් අධ්‍යයන සභාවේ සියලු සාමාජිකයන් පුහුණුකරුවන් විය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි 15 වන ඡේදයේ -

''(i) (3) (ඉ) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :-

''(ඉ) විශේෂඥ සභාවක ධූර කාලය අධ්‍යයන සභාවේ ධූර කාලය අවසන් වන දිනයේ දී අවසන් විය යුතු ය ;

එසේ වුවද, එවැනි විශේෂඥ සභාවක් විසින් මෙහෙයවනු ලබන හදිසි අධ්‍යයන හා විභාග සම්බන්ධිත කාර්යයන් පහසු කිරීම සඳහා විශේෂඥ සභාවක ධූර කාලය මණ්ඩලය විසින් දීර්ඝ කරනු ලැබිය හැකි ය ;''.

03 - 466

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.